උද්භිද උද්‍යාන භාර අරමුදල - 2021

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**-----**

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු වුවද එසේ වසා දැමීමට කටයුතු නොකර ව්‍යාවස්ථාපිත අරමුදලක් බවට පත්කර ඉදිරියටත් පවත්වාගෙන යාමට 2019 මාර්තු 01 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේදී සාකච්ඡා කර තිබුණි. එහෙත් 2022 මාර්තු 31 දින වන විට ද එය ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | උද්භිද උද්‍යාන සංවර්ධන අරමුදල නමින් නව ව්‍යවස්ථාපිත අරමුදලක් ඇතිකිරීමට සහ සංශෝධිත නව පනතට ඇතුළත් කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමට හෝ චක්‍රලේඛය අනුව වසා දැමීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,546,128 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 60,241,942 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 38,695,814 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ටිකට්පත් ආදායම රු. 37,030,400 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රාජකීය උද්භිද උද්‍යානයේ කෞතුකාගාර ගැලරිය ඉදිකිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුකර නොතිබුණද එම ක්‍රියාකාරකම සඳහා | 2021 දෙසැම්බර් 10 දින පැවති උද්‍යානභාර අරමුදලේ රැස්වීමේදී රාජකීය උද්භිද උද්‍යානයේ වර්ෂ 200 සපිරීම සැමරීමට අදාල කාර්යයන් කඩිනම් කිරීමටත් ඒ | අරමුදල මගින් ඉටු කිරීමට සැලසුම් කළ කාර්යයන් සඳහා වෙන්කළ |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්කරුට අත්තිකාරම් මුදල් ලෙස රු.13,604,179 ක් 2021 දෙසැම්බර් 30 දින ගෙවා තිබුණි. | සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් යොදා ගැනීමටත් අනුමැතිය ලබාගෙන එම ඉතිරිවූ ප්‍රතිපාදන මගින් මෙම ගෙවීම සිදු කළ බව දන්වා ඇත. | ප්‍රතිපාදන යොදවා ගත යුතුය. |
| (ආ) | වසර කිහිපයක සිට සමුච්චිත වෙමින් පවතින සියයට 25 ක ටිකට්පත් ආදායම රු. 140,824,507 ක් අරමුදල වෙත බාහිර පාර්ශවයක් වෙතින් ලැබීමට නොමැති වටිනාකමක් වන බැවින් එය අනුමැතිය ලබාගෙන ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය නාමිකව ගිණුම් සටහන් තැබූ ශේෂයක් වන අතර උද්‍යානභාරකාර අරමුදලේ ඉදිරි රැස්වීමකදී සාකච්ඡා කර මෙම ශේෂය ඉවත් කිරීමට හෝ සුදුසු කටයුත්තක් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | බාහිර පාර්ශවයකින් ලැබීමට නොමැති මුදලක් බැවින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015, 2018 සහ 2021 වර්ෂවලදී රු. 4,217,169 ක පිරිවැයක් දරා මුද්‍රණය කරන ලද රු.3,547,564 ක වර්ග 05 කට අදාළ අරමුදලේ විවිධ ප්‍රකාශන පිටපත් 2988 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොගයේ ඇතුළත්ව තිබුණි. එම ප්‍රකාශන අලෙවිය අඩු වශයෙන් සිදුවී තිබුණු අතර අවසන් තොගයේ වටිනාකමින් සියයට 84 ක්ම මෙම ප්‍රකාශනවල වටිනාකමින් සමන්විත වී තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය මත සංචාරකයන් අඩුවෙන් පැමිණීම හේතුවෙන් අලෙවිය අඩු වී ඇත. | ආරක්ෂිතව ගබඩාකර ඉදිරි වර්ෂ වලදී විධිමත්ව අලෙවි කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**අයවැය පාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මෙහි ක්‍රියාකාරකම් 08 කට අදාළව ඇස්තමේන්තුගත කර තිබූ රු.8,850,000 ක ප්‍රතිපාදනය ඉක්මවා රු.8,221,773 ක් එනම්, සියයට 93 ක් වැඩිපුර වියදම් දරා තිබුණි. එමෙන්ම ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉටු කිරීමට අපේක්ෂා කරන ලද ක්‍රියාකාරකම් 19 කට අදාළව ඇස්තමේන්තුගත කරන ලද රු. 67,450,000 ක මුදලින් රු.29,453,668 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇත. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල වසා තිබීමත් ප්‍රසම්පාදන කටයුතු නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීමත් හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ප්‍රතිපාදන සීමවන් තුල වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මේ නිශ්චිත කාර්යයන් සඳහන් නොකළ වැඩ සඳහා රු.2,600,000 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | උද්‍යානවල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීමට මෙලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත. | ඉටුකරනු ලබන කාර්යයන් පැහැදිලිව හදුනාගෙන ප්‍රතිපාදන සැලසිය යුතුය. |